DOI : 10.31357/fhssmst.2008.00669

# මුදල් පරිහරණය සමඟ බැඳුණු සමාජ හා සංස්කෘතික ලාක්ෂණිකයෝ නාගරික සමාජයෙහි දරිද්‍රතාවය කෙරෙහි ඇතිකළ බලපෑම

(මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඟුලාන උතුර හා දකුණ ග්‍රාම නිලධාරී වසම් ආශ්‍රයෙනි.)

බන්නැහැක මුදියන්සේලාගේ ප්‍රියන්ති කුමාරි බන්නැහැක
GS/SS/1571/2002

24 APR 2009

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය.

# කර්තෘගේ සහතිකය

සමාජ විද්‍යාව ශාස්ත්‍රපති උපාධි අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර මහතාගේ මාර්ගෝපදේශකත්වය යටතේ සම්පාදනය කරනු ලැබූවකි. මෙහි අන්තර්ගත කිසිදු කරුණක් වෙනත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද්දක් නොවන බව සහතික කරන අතර මෙහි අඩංගු සියලුම කරුණු සත්‍ය වශයෙන් ම පර්යේෂණය කිරීමෙන් සහ ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් රැස්කරගත් ඒවා බව සහතික කරමි.

කර්තෘ

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයන අංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.
2008-01-31

# උපදේශකතුමන්ගේ සහතිකය

සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා බී.එම්. ප්‍රියන්ති කුමාරි බන්නැහැක විසින් ඉදිරිපත් කරනු ලබන මෙම පර්යේෂණ නිබන්ධය මාගේ අධීක්ෂණය යටතේ සම්පාදනය කරනු ලැබූවකි. මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටමේ පවතින බව තවදුරටත් මෙයින් සහතික කරමි.

..............................................

ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර

ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර
අධ්‍යයනාංශ ප්‍රධාන
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ.

2009-4-23
.................................

දිනය

## උපකාරානුස්මෘති

- ❖ මෙම පර්යේෂණ නිබන්ධය සම්පාදනය කිරීමේ කාර්යයේ දී පර්යේෂණ ක්‍රමවේදයන් පහදා දීම, විෂය ගැටලු නිරවුල් කරදීම සහ නිවැරදි මගපෙන්වීම් කරමින් ඉතාමත් කැපවීමෙන් උපකාර කළ මහාචාර්ය බී.ඒ. ටෙනිසන් පෙරේරා ඇදුරිඳුටත්
- ❖ උපදේශකතුමන් වන ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර ඇදුරිඳුටත්
- ❖ වඩාත් සාර්ථක නිබන්ධනයක් නිම කිරීමට ධෛර්යය ලබාදුන් අනුරුද්ධිකා බුද්ධදාස ඇදුරුතුමියන්ටත්
- ❖ නිරතුරුව මා ධෛර්යමත් කරමින් උපදෙස් ලබා දුන් කථිකාචාරිණී නෙරංජි විජේවර්ධන සොයුරියටත්,
- ❖ අදාළ ක්ෂේත්‍ර පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා දෙමින් උදව් උපකාර කළ එම ක්ෂේත්‍රය හා සම්බන්ධ සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන්ටත්
- ❖ පර්යේෂණයේ ප්‍රධාන මූලාශ්‍රය වූ සියලුම දත්ත දායක අඟුලාන ප්‍රදේශවාසීන්ටත්

මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

# පටුන

**පිටු අංකය**

පළමුවැනි පරිච්ඡේදය - හැඳින්වීම සහ ක්‍රමවේදය 01-22

දෙවැනි පරිච්ඡේදය - නාගරීකරණය (සංකල්ප හා න්‍යාය විග්‍රහය) 23-73

2 : 1 සමාජ වෙනස්වීම හා නාගරීකරණය.

2 : 2 නාගරීකරණය හා ලෝක තත්ත්වය.

2 : 3 නාගරික සමාජ යනු කුමක්දැයි හඳුනා ගැනීම.

2 : 4 නාගරීකරණය හා ශ්‍රී ලංකාවේ තත්ත්වය.

2 : 5 නාගරීකරණය ආශ්‍රිත සමාජ ගැටලුවක් ලෙස දිළිඳුබව.

තුන්වැනි පරිච්ඡේදය - දිළිඳුබව (සංකල්ප හා න්‍යාය විග්‍රහය) 74-138

3 : 1 දිළිඳුබව යනු කුමක්දැයි හැඳින්වීම.

3 : 2 දිළිඳුබවට හේතු

3 : 3 දිළිඳු බව මැනීම හා දිළිඳුබව හා බැඳුණු සංකල්ප.

3 : 4 : I ඔස්කා ලෙවිස්ගේ දිළිඳුබවේ සංස්කෘතිය පිළිබඳ න්‍යාය.

3 : 4 : II දිළිඳුබවේ විෂම චක්‍රය

3 : 5 දිළිඳුබව පිළිබඳ ලෝක තත්ත්වය හා මෙරට තත්ත්වය, ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳුබව හා නාගරික දිළිඳුබව.

හතරවැනි පරිච්ඡේදය - මුදල් පරිහරණය හා දිළිඳුබව 139-162

4 : 1 මුදල්, මුදලේ විකාශනය හා මුදලේ කාර්ය

4 : 2 මුදල් පරිහරණය හා මුදල් කළමනාකරණය

4 : 3 බුදු දහමේ දක්වන මුදල් පරිහරණ ක්‍රමවේදය

4 : 4 ශ්‍රී ලංකාව තුළ මුදල් පරිහරණය හා නාගරික දිළිඳුබව

පස්වැනි පරිච්ඡේදය - දත්ත ඉදිරිපත් කිරීම හා නියැදිය 163-214

5 : 1 භූගෝලීය සීමාව, ඓතිහාසික තත්ත්වය හා වත්මන් පාරිසරික සමාජ, ආර්ථික තත්ත්වය

5 : 2 අධ්‍යයනයට ලක්වන පවුල් නියැදිය.

5 : 2 : I දිළිඳු සහන ලබන පවුල්

5 : 2 : II දිළිඳු සහන නොලබන පවුල්

5 : 3 එම පවුල්වල මුදල් පරිහරණය හා දිළිඳුබව

හයවැනි පරිච්ඡේදය - නිගමන හා යෝජනා 215-220

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

# පළමුවැනි පරිච්ඡේදය

# පළමුවැනි පරිච්ඡේදය

## හැඳින්වීම සහ ක්‍රමවේදය

ලෝකය එකම නගරයක් බවට පත්වීම අපි ගෝලීයකරණය නමින් හඳුන්වමු. වර්තමානය වන විට අභ්‍යවකාශය මෙන්ම, පෘථිවියද අපට ඉතා සමීපය. මිනිසා සමස්ත විශ්වයම ජය ගැනීමට උත්සාහ දරන පියවර ගණනාවක් සාර්ථක වී තිබේ. තාක්ෂණය මගින් බොහොමයක් දේ කළ හැකි වුවද පුද්ගල ජීවිත හා බද්ධ ඇතැම් දේ කළ නොහැකිබව මේ වන විට ඔප්පු වී තිබේ. තාක්ෂණය මගින් විශ්වය ජය ගත්තද පංති හා ජන වාර්ගික විෂමතාවය වැනි ඇතැම් සංසිද්ධීන් ජයගත නොහැකි බව ලොව ඉතා දියුණු, සශ්‍රීකත්වයෙන්, ධනයෙන් ආඪ්‍ය රටවල් පවා ඔප්පු කර තිබේ. මිහිපිට වෙසෙන එක් පුද්ගල කණ්ඩායමක් ඉතා සුඛෝපභෝගී ජීවිතත් තවත් පුද්ගල කණ්ඩායමක් අන්ත දුක්ඛිත ජීවිතත් ගත කරන්නේ ඇයිදැයි සැබැවින්ම සොයා බැලිය යුතු කරුණකි. ලෝකය කොතරම් දියුණු වුවද පංති විෂමතාවය මුලිනුපුටා දැමිය නොහැකි බවට තර්ක නගන්නෝ එය කර්මවාදය පදනම් කොටගෙන විග්‍රහ කිරීමට උත්සුක වෙති. පුද්ගලයා තමා කළ කී දෑ අනුව මෙලොව ජීවිත ගත කරන බවත් යහපත් දෙයෙහි නිරතව සිටියේ නම් සෞභාග්‍යමත් ජීවිත වලට හිමිකම් කියන බවටත් අයහපතෙහි නිරතව සිටියේ නම් දුක්ඛිත ජීවිත වලට හිමිකම් කියන බවටත් බුදු දහමේ හා හින්දු ආගමෙහි උගන්වනු ලබයි. මෙය මේ භවයෙහි මෙන්ම පෙර භවයෙහි ක්‍රියාවන් හා සබැඳෙයි. ඒ අනුව බුදු දහමෙහි හා හින්දු දහමෙහි දර්ශනය වන්නේ ලෝකය පවත්නා තාක් මෙකී විෂමතාවයෙහි මිනිසා ගැලී සිටින බවය.

කාල් මාක්ස් දක්වන පරිදි සියලු විෂමතාවයන්ගෙන් මිදිය හැක්කේ සමාජවාදී ආර්ථික, දේශපාලනික සමාජ ක්‍රමයකට මුළු ලෝකයම අවතීර්ණ වීමෙන් පමණක් බවය. එවැනි සමාජවාදී ක්‍රමයක් තුළ ධනපති, නිර්ධන යනාදී පංති ක්‍රමයක් දැකිය නොහැකි බවත් සියලුම දෙනා එක සමාන බවත් හෙතෙම මාක්ස්වාදී න්‍යාය ඔස්සේ විග්‍රහ කරයි. මේ අයුරින් දරිද්‍රතාවය හා සබැඳි විෂමතාවය පිළිබඳව කෙතෙකුත් තර්ක පවතී. මෙම තර්ක විතර්ක පසුබිමෙහි තබාගෙන දරිද්‍රතාවය හා එයට හේතු පිළිබඳ විමසා බැලීමේදී ඒ පිළිබඳ බොහෝ විෂයානුබද්ධ තොරතුරු, දත්ත ලබාගත හැකිවිය. දරිද්‍රතාවය හේතුකොටගෙන මිනිසුන් වර්ග වී තිබීමත් සමාජය පංති, තල, ස්ථර වලට කැඩී බිඳී තිබීමත් නිසා ඒ පිළිබඳ හේතු සාධක සොයා

බැලීම, නැතහොත් එය අධ්‍යයනය කිරීම කාලෝචිත යැයි හැඟේ. දියුණු නැතහොත් අප සංවර්ධිත රටවල් යැයි දක්වන රටවල් මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල්ද දරිද්‍රතාවය උග්‍ර සමාජ ප්‍රශ්නයක් ලෙස සලකා තිබේ. ශ්‍රී ලංකාව ඇතුළු දියුණුවෙමින් පවතින රටවල් ගණනාවක් සංවර්ධනයේ ලා බාධා ඇති කරන මෙකී දරිද්‍රතාවය ඉදිරි වසර කීපය තුළ මුලිනුපුටා දැමීමට සපථ කර තිබේ. ඒ ඒ රටවලට ආවේණික ක්‍රමවේද භාවිත කරමින් දරිද්‍රතාවය අවම කර ගැනීමට මෙකී රටවල් උනන්දු වන බව පෙනෙතත් තවමත් එහි සාර්ථක ප්‍රතිඵල ළඟා කරගත් බවක්ද පෙනෙන්නට නැත. එබැවින් මෙවැනි පසුබිමක් තුළ ලංකාවේ නාගරික දරිද්‍රතාවය කෙරේ බලපාන සාධක මූලික කොටගෙන සිදුකරන මෙම අධ්‍යයනය වඩා විශේෂිත වූවක් බව පෙනේ.

සමාජ විද්‍යාව ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව අවසන් පරීක්ෂණයට නියමිත ස්වාධීන අධ්‍යයන නිබන්ධය වෙනුවෙන් මෙහිදී අධ්‍යයනය කරන්නට යෙදුණේ "නාගරික සමාජ ජීවිතයෙහි මුදල් පරිහරණය හා දිළිඳුකමෙහි සංස්කෘතිය" යන තේමාව මූලය කොටගෙන ඒ හා සම්බන්ධ විෂය පථයයි. මෙහිදී අදාළ පර්යේෂණය සඳහා ක්ෂේත්‍රය කොට ගැනුණේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඟුලාන උතුර හා දකුණ ග්‍රාම නිලධාරී වසම් ද්විත්වයයි. මාසික ආදායම අනුව වර්ග කෙරෙන "දිළිඳු" යන ජන කොට්ඨාසය නැතහොත් සමෘද්ධි සහනාධාර ලබන පිරිස මෙහිදී පර්යේෂණයට භාජනය කෙරුණු අතර පර්යේෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමෘද්ධි සහනාධාර නොලබන, දරිද්‍රතා මට්ටමෙන් ඔබ්බට ගිය සාමාන්‍ය ජීවිත ගත කරන්නවුන්ද අධ්‍යයනය සඳහා තෝරා ගැනුණේ සංසන්දනාත්මක අධ්‍යයනයක් මගින් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකිවීමත් විශ්වසනීයත්වය තහවුරු කරගත හැකිවීමත් නිසාය. අධ්‍යයනයේ වැදගත්කම විමසා බැලීම මෙහිදී ප්‍රයෝජනවත් විය. දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ දැවෙන ප්‍රශ්නයක් බවට පත්ව ඇති දරිද්‍රතාවය තවත් බොහෝ අතුරු ප්‍රශ්න රැසකට මූල බීජය වෙයි. අපචාර, අපරාධ, ඇතුළු අනෙකුත් විෂමාචාර ක්‍රියා බොහොමයක් ඇතිවන්නේ දරිද්‍රතාවය හේතුකොට ගෙනය. එපමණක් නොව විවිධ පෝෂණ ඌණතා, අඩු ආයු අපේක්ෂාව, උපතේදී බර අඩුවීම, ගබ්සා වීම යනාදී විවිධ සෞඛ්‍යමය ගැටලු, ආත්ම විශ්වාසය හීන වීම, පෞරුෂත්ව දුර්වලතා, කොන්වීම හා නොසලකා හැරීම යනාදී සමාජමය ගැටලු, අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා මුදල්

නොමැතිකම යනාදී ආර්ථිකමය ගැටලු, පරාධීන බව, හුදකලා වීම, ඉච්ඡාභංගත්වය, කාංසාව ඇතුළු විවිධ මානසික ගැටලු උත්පාදනය වන්නේද දරිද්‍රතාවය නිසාමය. දියුණු වෙමින් පවතින රටවලට ප්‍රබල ප්‍රශ්නයක් වන දරිද්‍රතාවය අවම කිරීම අභියෝගයක්ව තිබේ. දරිද්‍රතාවය හා බැඳුණු නූගත්කම ද තෙවන ලොව රටවල් හමුවේ පවතින ප්‍රබල බාධකයකි. දරිද්‍රතාවය කිසිදිනක මිහිමතින් මුලිනුපුටා දැමිය නොහැකිය. එසේම කවර රටක වුවද (සංවර්ධිත රටවල පවා) යම්තාක් දුරකට දරිද්‍රතාවයක් දැකගත හැකිය. එහෙත් සංවර්ධනයේලා බාධකය වන්නේ එවැනි තත්ත්වයක් නොවේ. තෙවන ලොව හමුවේ බලපවත්වන ඉතා දුක්ඛිත තත්ත්වයකින් පවතින දරිද්‍රතාවයයි. එකී රටවල ජීවත්වන ජනතාවගේ දෛවය කර්මයට බාරකරන මානසිකත්වයක් ඇති කරන දරිද්‍රතාවයයි. එබැවින් මෙම දරිද්‍රතාවය පිළිබඳව අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙස සැලකිය හැකිය.

මෙම අධ්‍යයනය ඉලක්ක කරන්නේ නාගරික දරිද්‍රතාවය හා ඒ හා බැඳුණු සමාජ සංස්කෘතික දිවිපෙවෙත කෙරෙහිය. නාගරික දරිද්‍රතාවය පිළිබඳව මේ වන විට පර්යේෂණ රැසක් සිදුකර ඇති නමුදු අදාළ පර්යේෂණ ක්ෂේත්‍රයේ එනම් අඟුලාන උතුර හා දකුණ ග්‍රාම නිලධාරී සේවා වසම් ද්විත්වයෙහි දරිද්‍රතාවයේ ප්‍රමාණය, රටාව හා ස්වභාවය පිළිබඳ මෙතෙක් කිසිදු පර්යේෂණයක් සිදුකර නොමැතිවීම සුවිශේෂී කාරණයකි. මේ දක්වා මෙම ක්ෂේත්‍රය කේන්ද්‍රකොටගෙන සිදුකර ඇති පර්යේෂණ ඇත්තේ අතළොස්සක් වුවද ඒවායෙහිද දරිද්‍රතාවය, මුදල් පරිහරණය වැනි මාතෘකා පිළිබඳව අවධානය යොමුකර තිබුණේ ඉතා අල්ප වශයෙනි. දැනට අදාළ ක්ෂේත්‍රයද ඇතුළුව තවත් ක්ෂේත්‍ර ගණනාවක් ඉලක්ක කරගෙන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් "ලුනාව වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූවද "දරිද්‍රතාවය හා මුදල් පරිහරණය" යන ක්ෂේත්‍රය ඔවුන්ගේ පර්යේෂණයට අදාළ වන්නේ නැත. ඔවුන්ගේ මූලික ඉලක්කය වන්නේ වෙරළ හා අඟුලාන කලපුව ආරක්ෂා කිරීම හා සංවර්ධනයයි. ක්ෂේත්‍රය තුළ සිදුකර තිබූ අනෙක් පර්යේෂණ අතළොස්ස හා විවිධ ව්‍යාපෘති ද මූල්‍යමය අරමුණු මත පමණක් ක්‍රියාත්මක වූ ඒවා විය. මෙම පර්යේෂණ විවිධ අරමුණු මත පිහිටා ක්‍රියාත්මක වුවද "දිළිඳු බව හා මුදල් පරිහරණය" ඒ කිසිදු පර්යේෂණයක පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය කර තිබුණේ නැත. එකී පර්යේෂණවල

ප්‍රධාන අරමුණ ඔස්සේ දත්ත රැස්කිරීමේදී ඒ පිළිබඳ හුදෙක් සඳහනක් පමණක් කර ඇති බව පෙනේ.

අනෙක් අතට දරිද්‍රතාවයේ ස්වරූපය විවිධ රටවලට, සමාජ වලට ග්‍රාමීයව මෙන්ම නාගරිකවද බලපවත්වන්නේ විවිධාකාරයෙනි. ඒ අනුව මෙම අධ්‍යයනය සඳහා නාගරික දරිද්‍රතාවය පාදක වන අතර එහිදීද සුවිශේෂී ජන කොට්ඨාසයක් වන වෙරළබඩ ජීවත්වන දරිද්‍රතාවයෙන් පෙළෙන්නවුන් අදාළ පර්යේෂණය සඳහා ගොනුකර ගැනීම විවිධත්ව රැසකින් යුතු ප්‍රපංචයක් අධ්‍යයනය කිරීමක් වශයෙන් සැලකිය හැකිය. මිනිසුන්ගේ ආදායම හා වියදම මූලික කරගෙන ඔවුහු ගෙවන සමාජ ජීවිතය තීරණය වන බව පැහැදිලි කෙරෙන මෙම අධ්‍යයනය ඉතා කාලෝචිත මෙන්ම දරිද්‍රතාවයට හේතු කාරක සොයන කවරෙකුට වුවද නව මං සොයා යාමට දිරි දෙන්නකි. දුප්පත්කම, මත්ලෝලීත්වය, නූගත්කම යන සාධක ත්‍රිත්වය එකිනෙකට වූ අවියෝජණීය සබඳතාවයකින් යුතුව එකම සංකීර්ණ ප්‍රපංචයක මහා බලකණු තුනක් ආකාරයෙන් ක්‍රියාත්මක වන බව මෙම අධ්‍යයනය මගින් තව දුරටත් පැහැදිලි කරගත හැකිය. මුදල් පරිහරණ රටාව පුද්ගලයා ධනවතෙකු හෝ දිළින්දෙකු බවටත් පත් කරන බව අමුතුවෙන් කිව යුතු නොවේ. මෙම මුදල් පරිහරණ රටාවද සංස්කෘතියේම එක් අංගයකි. එය හා ඍජුව බල පවත්වන්නකි. නාගරික වෙරළ ආශ්‍රිත මෙම අධ්‍යයන ක්ෂේත්‍රයේද බලපවත්වන සංස්කෘතිය එහි වැඩෙන්නෝ දිළින්දන් බවට පත්කරන බව මෙම අධ්‍යයනය මගින් පෙන්වා දෙයි. එහෙයින් මෙම අධ්‍යයනය එම ක්ෂේත්‍රයේ මෙන්ම ඒ හා සමාන අනෙකුත් ක්ෂේත්‍රවල කටයුතු කරන ප්‍රතිපත්ති සම්පාදකයන්ට ද කදිම මූලාශ්‍ර සපයන තෝතැන්නක් මෙනි.

දරිද්‍රතාවය සඳහා ඔස්කා ලෙවිස් (Oscar Lewis) හා රැග්නාර් නර්ක්ස් (Ragner Nurkse) වැනි බොහෝ න්‍යායවාදීන් මෙතෙක් හේතු ලෙස දැක්වූයේ අඩු ආදායමයි. ආදායම අඩු වුවද එකී ආදායම නිසි ලෙස පරිහරණය කිරීම තුළ දරිද්‍රතාවයෙන් මිදීමට හැකි බව ඔවුන්ගේ අදහස නොවීය. එහෙත් දරිද්‍රතාවය පිළිබඳව අදහස් දැක් වූ පෝල් ෆියරේ (Paul Frievie) රොබට් චැම්බර්, (Robert Chamber) නොර්මන් අප්හොෆ් (Norman Uphoff)වැනි සමාජ විද්‍යාඥයින් එය එසේ නොවේ යැයි නැතහොත් ආදායම් අඩුකම පමණක් දරිද්‍රතාවයට ප්‍රධාන හේතුව නොවන බවද පෙන්වා දෙනු ලැබීය. මෙම අධ්‍යයනයෙන්ද පෙන්වා දෙනු

ලබන්නේ ආදායම් අඩුකමට වඩා වෙනත් හේතුන් එනම් මුදල් පරිහරණයේ දුර්වලතා දරිද්‍රතාවය සඳහා බලපානු ලබන බවයි. එය නව ආරක දරිද්‍රතා ගවේෂණ සඳහා මං පෙත් විවර කරන්නකි.

1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා නව ප්‍රවණතාවයන් විවිධ ක්ෂේත්‍රවලට යහපත් හා අයහපත් ආකාර වලින් බලපෑවද දරිද්‍රතාවය සඳහා එය හිතකර බලපෑමක්ම එල්ල කරන්නට යෙදුණි. එකී සමාජ, ආර්ථික පරිසරය තුළ දරිද්‍රතාවය වඩාත් සශ්‍රීකව වැඩෙන්නට වූ නිසාම එය මෙරට අන්ත දුගියන් දහස් ගණනින් ජනනය කිරීමට හේතු කාරක විය. විවෘත ආර්ථික ක්‍රමය තුළින් ගම් නගර බවට පත්වීම සඳහා තල්ලු කිරීමේ සාධක ජනිත වූ අතර නගරවලද ශීඝ්‍ර වර්ධනයක් හා සංවර්ධනයක් ඒ ඔස්සේ සිදු විය. මෙහි ප්‍රතිඵලය වූයේ ග්‍රාමීයව ස්වයංපෝෂිතව පැවැති ආර්ථික ක්‍රමය දෙදරා යාමත් ඒ තුළින් දුප්පත්කම වර්ධනය වීමත්ය. නාගරික ක්ෂේත්‍රයේ එයට නොදෙවෙනි වූ ලක්ෂණ දිස්වන්නට වූ අතර නාගරීකරණය හරහා අලුත් සංස්කෘතියක් බිහිවී ඒ වටා දුප්පතුන් රාශියක් ගොනුවන්නට විය. එබැවින් එකී කාරණා ඔස්සේ මෙම අධ්‍යයනය කේන්ද්‍රගත වූයේ මෙම නාගරික දුප්පතුන්ගේ දරිද්‍රතාවය පිළිබඳ සොයා බැලීම සඳහාය.

නගරය යනු ඉතා සුඛෝපභෝගී යාන වාහන, නිවාස වලින් යුතු නානාවිධ සංකීර්ණ තාක්ෂණික උපකරණ සහිත කාර්යාල හා කර්මාන්ත ශාලා වලින් යුතු, විවිධ සුඛෝපභෝගී භාණ්ඩ වලින් පිරි වෙළඳ සැල් වලින් යුතු විනෝදජනක ජීවිත ගත කරන්නන්ගෙන් පිරි සුරපුරක් නොවන බවත් අන්ත පීඩාකාරී, දුක්ඛිත ජීවිත ගතකරන්නන්ගෙන් යුතු ප්‍රදේශ ඉහත දැක්වූ සුන්දරත්වයට ඔබ්බෙන් පවතින බවත් එකී ජීවිත ගෙවන්නට ඔවුන්ට බලපෑ හේතු සාධක කවරේද යන්න සොයා බැලීම වැදගත් බවත් එම හේතු සඳහා වහ වහා පිළියම් යෙදිය යුතු බවත් ඒ පිළියම් කවර ආකාරයෙන් යුතු ඒවාද යන බවත් මෙම අධ්‍යයනයෙන් පැහැදිලි කරනු ලබයි.

එබැවින් සමස්තයක් ලෙස මෙම අධ්‍යයනය අදාළ ක්ෂේත්‍රය හා සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන්ටද, සැලසුම් සකස් කරන්නන්ටද, ප්‍රතිපත්ති

සම්පාදකයන්ටද, කළමනාකරුවන්ට පමණක් නොව දරිද්‍රතාවයේ ගැළී සිටින්නන්ටද තීන්දු තීරණ ගැනීමේදී, දරිද්‍රතාවය අවම කිරීම සඳහා ඉවහල් වන බව හැගේ. දරිද්‍රතාවය සඳහා මනෝමූලික කාරණු රාශියක් බලපාන බව මෙහිදී පෙනී යන කරුණකි. එබැවින් දරිද්‍රතාවය දෛවයට, කර්මයට බාරදෙන ජනතාවක් සිටින ලංකාව වැනි තෙවැනි ලොව රටවල ජනතාවගේ එකී සෘණාත්මක ආකල්ප වෙනස් කිරීම සඳහා මෙවැනි පර්යේෂණ මනා පිටුවහලක් සපයනු ඇත. එපමණක් නොව මෙම අධ්‍යයනය හුදෙක් මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඟුලාන උතුර හා දකුණ ප්‍රදේශ වලට පමණක් සීමා වූ ශුද්‍ර අධ්‍යයනයක් නොව සමස්ත ශ්‍රී ලාංකික නාගරික දරිද්‍රතාවයෙන් පෙළෙන්නවුන් සඳහාම වන සාර්ව අධ්‍යයනයක් ලෙස සලකා කටයුතු කළ හැකි බැවින් මෙය කාලෝචිත මෙන්ම ජාතික වැදගත්කමක් ඇති පර්යේෂණයක් බවද පෙන්වා දීම වටී.

## 1.2 අධ්‍යයනයේ අරමුණු

"මුදල් පරිහරණය සමඟ බැඳුණු සමාජ සංස්කෘතික ලාක්ෂණිකයෝ නාගරික සමාජයෙහි දරිද්‍රතාවය කෙරේ ඇතිකළ බලපෑම" යන මැයෙන් සිදු කළ මෙම පර්යේෂණය අරමුණු කීපයක් මුල්කරගෙන සිදුකෙරිණි. මෙහිදී නාගරික ජනතාවගේ ආදායම හා වියදම කෙබඳු ආකාර වේදැයි හඳුනා ගැනීමත්, ඔවුන්ගේ වියදම සහ දුප්පත්කම අතර ඇති සබඳතාවය හඳුනා ගැනීමත් අරමුණු කොට ගැනුණි. දුප්පත් ජනතාවට එසේ වීමට හේතුව ලෙස බොහෝ දෙනා දකින්නේ අඩු ආදායම් හිමිවීමයි. අඩු ආදායම් ලැබීම නිසා දුප්පතාට එයින් මිදීමට නොහැකි වීමෙන් තව තවත් දරිද්‍රතාවයට ලක්වෙන බවත් ඔවුනටම ආවේණික සංස්කෘතියකට හිමිකම් කියන බවත් ඒ අනුව ගොඩ නැගෙන තර්කයයි. එහෙත් ඔවුනට ලැබෙන අඩු ආදායම නිසි පරිදි පරිහරණයෙන් දුගීබවෙන් මිදීමට හැකි බවට තර්ක නගන්නෝද සිටිති, ඔවුන්ට ලැබෙන ආදායම හා ඔවුන් කරන වියදම කොපමණක්ද, කවර ආකාරයෙන්ද යන්න පිළිබඳව සොයා බැලිය යුතු වන්නේ ඉහත තත්ත්ව තුළය. ඔවුන්ගේ ආදායමට වඩා අඩු ආදායම් හිමිවූවන්ද නිසි පරිදි වියදම් පාලනය කර ඉතිරිකිරීම් සහ ආයෝජන කිරීමෙන් දරිද්‍රතාවයෙන් මිදී සාමාන්‍ය ජීවිත ගතකරන්නන් බවට පත්ව සිටිනු දැකිය හැකි බව මේ අයගේ තර්කයයි. එබැවින් දරිද්‍රතාවයට බලපාන හේතු සොයා බැලීමත් ඒ හේතු අතර අඩු ආදායම ප්‍රබල වන්නේද යන්න සොයා බැලීමත් ඒ සඳහා අඩු ආදායම මෙන්ම වැඩි

වියදම හේතුවන්නේදැයි සොයා බැලීමත් මෙහිදී අරමුණු කොට ගැනුණි. ඒ අනුව අදාල ක්ෂේත්‍රයේ දරිද්‍රතාවය මුල්බැස ගැනීමට හේතු වූ මුදල් පරිහරණය සමඟ බැඳුණු සමාජ සංස්කෘතික ලාක්ෂණිකයෝ කවරේද යන්නත් මේ සමාජ සංස්කෘතික ලාක්ෂණිකයෝ කවර බලපෑමක් එල්ල කළේ ද යන්නත් සොයා බැලීම අරමුණු කොටගෙන මෙම පර්යේෂණය සිදුකෙරිණි.

## 1.3 අධ්‍යයනයේ සීමා හා ගැටලු

"නාගරික සමාජ ජීවිතයෙහි මුදල් පරිහරණය හා දිළිඳුකමෙහි සංස්කෘතිය" යන මැයෙන් සිදුකරන ලද මෙම පර්යේෂණයේදී යම් යම් සීමා ඇතිකර ගැනීමට සිදුවිය. මෙම පර්යේෂණය සඳහා දිස්ත්‍රික්කයක් තබා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හෝ අධ්‍යයනය කිරීම ප්‍රායෝගික ගැටලු මතු කරන බැවින් මොරටුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ග්‍රාමසේවා වසම් දෙකක් පමණක් තෝරා ගැනීමට සිදුවිය. ඒ අඟුලාන උතුර හා දකුණ ග්‍රාම නිලධාරී වසම් දෙකය. එයින්ද සමස්ත පවුල් ප්‍රමාණයෙන් පවුල් 93ක ප්‍රමාණයක් තෝරා ගැනීමට සිදුවිය.

මෙම සුළුතරය එනම් සමස්ත ප්‍රමාණයෙන් 15% ක පමණ පවුල් ප්‍රමාණයක් අධ්‍යයනයට හසුකිරීමෙන් සමස්ත අධ්‍යයන ක්ෂේත්‍රය කෙරේම අවබෝධයක් ලබා ගැනීම දුෂ්කර විය හැකිය. එළඹෙන නිගමන ඇතැම් විට වැරදි ඒවා විය හැකිය. එහෙත් එකී දුර්වලතාව මඟ හරවා ගැනීම සඳහා භාවිත කළ උපක්‍රමය වූයේ අදාළ ක්ෂේත්‍රයේ දිළිඳු නොවන ජනගහනයද අධ්‍යයනයට හසුකර සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදුකිරීමයි. එමගින් යම්තාක් දුරකට මෙම දුර්වලතාවය මග හරවා ගැනීමට හැකිවූවායැයි සිතමි.

මෙම පර්යේෂණය සිදුකරන කාලය තුළදී එම පර්යේෂණ ක්ෂේත්‍රය තුළ නැවතී සිටීමට අදහස් කළද සුනාමි ව්‍යසනයෙන් පසුව එම අදහස වෙනස් කිරීමට සිදුවිය. එසේ නමුත් ක්ෂේත්‍රය හා වසර දෙකක් පමණ සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට හැකිව තිබූ බැවින් එය ප්‍රබල ගැටලුවක් නොවීමට වග බලා ගතිමි. වසර දෙකක් පමණ අදාළ ක්ෂේත්‍රයේ වාසය කිරීම

නිසා දත්ත දායකයන්ගේ ජීවන ක්‍රමය පිළිබඳව යම් වැටහීමක් ලබා ගැනීමට හැකිවීම මෙම පර්යේෂණය කරගෙන යාමට ආශිර්වාදයක්ම විය.

මෙම පර්යේෂණය ඉතා ඉක්මනින් සිදුකිරීමට නියමිතව තිබුණ ද අනපේක්ෂිතව පැමිණි සුනාමි ව්‍යසනය මගින් දත්ත දායකයන් අදාළ ප්‍රදේශයෙන් ඉවත් කර තිබිණි. අඟුලාන උතුර ග්‍රාම නිලධාරී වසමේ දත්ත දායකයන් අවතැන්ව සිටි අතර ඒ හා සම්බන්ධව තවත් අතුරු ප්‍රශ්න රැසක් පැන නැගී තිබුණි. ග්‍රාම නිලධාරීවරයා පවා මාරුවී සිටි අතර දත්ත දායකයන් අවතැන් වී පොදු ජය විදුහල කඳවුරට කොටු විය. මුල් අවධියේදී තොරතුරු ලබාගත් ඇතැම් දත්ත දායකයන් සුනාමි ව්‍යසනයෙන් පසු සොයාගත නොහැකි විය. ඔවුහු දුර පළාත්වල නෑදෑයන් සමග වාසය කිරීම එයට හේතුවයි. මේ නිසා නැවත මුල සිට දෙවැනි වතාවටත් තොරතුරු රැස් කිරීමට සිදුවිය. සුනාමි සහන කඳවුරෙහි අඟුලාන උතුර ග්‍රාම නිලධාරී වසමේ ජනයා පමණක් නොව අනෙක් ප්‍රදේශවල සුනාමි ව්‍යසනයට ගොදුරුවූ ජනයාද වාසය කරන්නට වූ නිසාම කඳවුරු වලට ගොනු වූ අදාළ දත්ත දායකයන් පවා සොයා ගැනීම දුෂ්කර කටයුත්තක් විය. එමෙන්ම එම පුද්ගලයන් සොයා ගැනුණද ඔවුන් මීට පෙර ලබාදුන් තොරතුරු පවා වෙනස් වී තිබුණි. ඉතා පැහැදිලි සමාජ, ආර්ථික, සංස්කෘතික වෙනස්කම් ගණනාවක් පර්යේෂණය සිදුකළ කාලය අතරතුරදී ඔවුන්ගෙන් දෘශ්‍යමාන විය. සුනාමියට පෙර ඔවුහු ගතකළේ සාමාන්‍යයෙන් වෙරළබඩ වෙසෙන අනෙකුත් ධීවර ජනතාව ගතකරන ආකාරයේ දිවිපෙවෙතකි.සුනාමියෙන් අනතුරුව ඔවුන්ගේ ජීවිත වඩාත් දුක්ඛිත, පීඩාකාරී මෙන්ම කැළඹිළි සහිත ඒවා විය. එහෙත් සුනාමියෙන් මසක් දෙකක් ඇවෑමෙන් ඔවුහු එයට පෙර ජීවත් වූ වඩා සැහැල්ලු විනෝදකාමී මෙන්ම අතිශය වියදම්කාරී ජීවිතවලට නැඹුරුවූහ. මෙකී ස්වභාවයන් අදාළ පර්යේෂණයේදී මහත් ගැටලුකාරී විය. වහ වහා වෙනස්වන සුළු ඔවුන්ගේ මෙම ජීවන ක්‍රමය මෙබඳු පර්යේෂණවලදී සත්‍ය තොරතුරු ලබාගැනීමෙන් බොහෝ දුරස් වේ. එපමණක් නොව පැහැදිලි නිගමනවලට එළඹීමටද බාධා මතුකරයි.

මේ අයුරින් එක් රැස්කළ සියලු දත්ත තොරතුරු අවුල් වියවුල් වී යාම නිසා ක්ෂේත්‍රයට යාම මඳ කලකට අත්හිටවූ අතර සුනාමියෙන් කැළඹුණු මුහුද කාලයාගේ ඇවෑමෙන් යථා

තත්ත්වයට පත්වූවාක් මෙන් ඔවුන්ගේ ජීවිතද යථා තත්ත්වයට පත්කිරීමට කාලයාට බාර කරමින් පර්යේෂණයට අදාළ අනෙකුත් මූලාශ්‍ර, න්‍යායාත්මක කරුණු ගවේෂණය කරමින් සැලකිය යුතු කාලයක් ක්ෂේත්‍රයෙන් බැහැරව සිටියෙමි. සතුටුදායක මට්ටමකට පර්යේෂණයට හිතකර තත්ත්වයක් උදාවීමට වසරක් පමණ ගතවිය. සුනාමියෙන් වසර තුනක් ගතව ඇති වර්තමානය වන විට ඔවුහු පෙර මෙන්ම සාමාන්‍ය ජීවිතවලට හුරුව සිටිති. එය මෙම පර්යේෂණය සඳහා ආශිර්වාදයක්ම විය.

මෙහිදී මතු වූ තවත් ප්‍රධාන ගැටලුවක් වූයේ රජයේ නිලධාරීන් හා දත්ත දායකයන් අතර පවතින දුරස්ථභාවයයි. විශේෂයෙන්ම ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ආදීහු තම රාජකාරී ප්‍රදේශය පිළිබඳව හා එහි වාසය කරන ජනතාව පිළිබඳ මනා වැටහීමකින් යුතු නොවීමත් දුර්වල සමාජ සබඳතා වලින් යුතු වීමත් පර්යේෂණයේදී ප්‍රබල බාධකයක් විය. බොහෝ විට ඔවුන් සම්බන්ධව ලේඛන පවත්වාගෙන යන ලිපි ලේඛනවල අඩංගු කරුණුවල සත්‍යතාවය පිළිබඳ ගැටලු මතුවිය. පැහැදිලි, ක්‍රමානුකූල දත්ත ලබාගැනීමේ අපහසුතාවය මෙන්ම දත්තවල ව්‍යාකූල බව ඉතා ප්‍රබලව බල පැවැත්විණි. මෙසේ වීමට එක් හේතුවක් ලෙස ඔවුන් සඳහන් කරන්නේ සුනාමි ව්‍යසනය නිසා ජනතාව අවතැන් වීමත් ආගන්තුක පිරිස් එම ක්ෂේත්‍රයේ පදිංචි වීමත්ය. කෙසේ වුවද ක්ෂේත්‍රයේ ඇවිද ලබාගත් තොරතුරු සහ නිලධාරීන්ගෙන් ලබාගත් දත්ත එකිනෙකට පරස්පර විය. මේ ගැටලුව මගහරවා ගැනීමට අදාළ රාජ්‍ය නිලධාරීන් සමග සාකච්ඡා කොට අදාළ දත්ත හා තොරතුරු එකින් එක නිරවුල් කර ගැනුණි.

ඉහතින් දැක් වූ අයුරින් මෙම පර්යේෂණය සිදුකිරීමේදී විවිධ බාධා මතුව තිබුණද විවිධ උපක්‍රම මගින් එකී බාධා ජය ගැනීමට හැකිවිය.